**යාපනය සමග ඇති ඇමෙරිකන් සබඳතා, එක්සත් ජනපද ගුවන් හමුදාව ශක්තිමත් කරයි.**

**අගෝස්තු 12, 2016:** මුල් ඇමෙරිකන් මිෂනාරීන් යාපනයට පැමිණියේ 1813 දී වන අතර පූජ්‍ය සැමුවෙල් නෙවෙල් විසින් තෙලිප්පලෙයි පළමුවැනි ඇමෙරිකන් මිෂනාරි පාසල ආරම්භ කළේය. ඉන් පසුව උතුරු ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් පාසැල් හා වෛද්‍ය මධ්‍යස්ථාන සිය ගණනක් ඉදි කරන ලදී. අපේ ජනතාවන් අතර ඇති මෙම ගැඹුරු සබඳතාව දිගටම පවත්වා ගනිමින් පාසැල් ප්‍රතිසංස්කරණය කිරීමටත්, යාපනේ ජනතාවට අවශ්‍ය වෛද්‍ය සේවා ලබාදීමටත් පැමිණෙන එක්සත් ජනපද ගුවන් හමුදාවේ පැසිෆික් ඒන්ජල් මෙහෙයුම් කණ්ඩායම මෙම සතියේ යාපනය පිළිගනු ඇත.

පැසිෆික් ඒන්ජල් කණ්ඩායමේ කටයුතුවලට සහභාගීවීමටත් දේශපාලන නායකයන්, සිවිල් සමාජ, මාධ්‍ය නියෝජිතයන් හා අනිකුත් අය මුණ ගැසීමටත් මෙම සතියේ යාපනයට යෑමට ලැබීම ගැන මම සතුටු වෙමි. ශ්‍රී ලංකාවේ අනාගතය ගැන එක්සත් ජනපදය කැපවී සිටී. 2015 ජනවාරි මාසයේ පැවැත්වූ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය රටේ දේශපාලන ගමන් මගේ ඓතිහාසික වෙනසක් කළ අතර එක්සත් ජනපදය සමග නව සබඳතාවක් ගොඩ නගා ගත්තේය. ප්‍රජාතාන්ත්‍රික ආයතන විනාශ කිරීමට ක්‍රියා කළ අධිකාරිවාදී රජයක් ප්‍රතික්ෂේප කළ ශ්‍රී ලාංකික ඡන්ද දායකයන් යහපාලනය හා ජාතික ප්‍රතිසන්ධානය පොරොන්දු වූ නව රජයක් බලයට පත් කර ගත්තේය. දීප්තිමත් දේශපාලන හා ආර්ථික අනාගතයක් සඳහා නව රජය වැදගත් පියවර ගණනාවක් ගෙන ඇති අතර ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් අතර සබඳතා වැඩි දියුණු කිරීමටද පියවර ගෙන තිබේ. මෙය අවබෝධ කරගෙන ඇති එක්සත් ජනපදය හා ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාව සමග සබඳතා වැඩි කිරීමට පියවර ගෙන තිබේ.

එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ජෝන් කෙරී දුන් පොරොන්දුව පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාවට පැමිණෙන ඇමෙරිකානු අමුත්තන් සංඛ්‍යාවේ වැඩි වීමක් ඔබ දැක ඇති බවට සැකයක් නැත. ඔහු එදා ප්‍රකාශ කළේ "අවුරුදු ගණනාවක දුෂ්කරතා හා දුක් වේදනාවලින් පසුව සාමයෙන් හා සෞභාග්‍යයෙන් පිරි අනාගතයක් මෙන්ම ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී රටක් ගොඩ නගන ඔබ අසළින්ම එක්සත් ජනපදය සිටින" බවයි. මෙම සංචාරවලින් පැහැදිලි වන්නේ, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කීර්තිය, ආර්ථික වර්ධනය, සංවර්ධන ආධාර හා හමුදාවේ වෘත්තීය තත්වය වැඩි දියුණු කිරීමට එක්සත් ජනපදය පුළුල් පරාසයක ආධාර කරන ආකාරයයි.

අතීත භීෂණය, දශක තුනක ප්‍රචණ්ඩත්වය හා ප්‍රජාතන්ත්‍ර-විරෝධී ආණ්ඩු ඇතුළු සියල්ල අපේ මතකයේ රැඳී තිබේ. එය, දැන් තත්වය සමග සසඳා බලන්න. සිවිල් සමාජ කණ්ඩායම් ඉතා ක්‍රියාකාරී වන අතර ඔවුන් රජයේ කාර්ය සාධක බලකායන්හී ප්‍රධාන උපදේශකයන් ලෙස කටයුතු කරති. මාධ්‍යවේදීන් නිදහසේ ලියන අතර තව දුරටත් පැහැර ගැනීම් ගැන බිය නොවේ. යාපනයේ හා අනිකුත් පෙදෙස්වල නව හෝටල්, ව්‍යාපාර හා අවන්හල් විවෘත වේ. අතුරුදහන්වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීමේ පනත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම අතුරුදහන්වූ පුද්ගලයන් හා ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් තැබූ වැදගත් පියවරකි.

යාපනේ ජනතාවට අවශ්‍ය වී ඇති පිළිසකර කිරීම් හා උපකරණ ලබා දීමට පැසිෆික් ඒන්ජල් ආධාර වැඩ සටහන, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමග එක්ව කටයුතු කරනු ඇත. අපේ සංචාරයන් හා වැඩ සටහන්වලින් එකක් වන මෙයින් පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රජාවන් අතර සියලුම මට්ටම්වලදී සබඳතා ශක්තිමත් කරමින් ඔබ සමග ගමන් කිරීමට අප දක්වන කැපවීමයි. ප්‍රජාතාන්ත්‍රීය පරිණාමනය සමග ඔබේ රටට පුළුල් අන්තර්ජාතික සහයෝගයක් ලැබී ඇත්තේ අප සැම දෙනාටත් ශ්‍රී ලාංකික ජනතාවටත් ඇත්තේ එකම දැක්මක් බැවිනි. එනම් ගැටුම් වැඩි වන ලෝකය තුළ ශ්‍රී ලංකාවට සාමය, ප්‍රතිසන්ධානය, ප්‍රජාතන්ත්‍රවාදය හා සෞභාග්‍යය පිළිබඳ දීදුලන ආදර්ශයක් විය හැකි බවයි.